# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1972/51 - 2016 ජුනි මස 24 වැනි සිකුරාදා - 2016.06.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : DIVWR/LND/AURAQ/10/5.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : LD/05/2009/PC/17.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩම් වල විස්තර :-*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1239 - විලාකටුපොත - ග්‍රාම නිලධාරි වසමේ, පාලුගම ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 2521 හි පත්‍ර 05 අතිරේකය 05 හි දැක්වෙන පහත විස්තර සඳහන් ඉඩම් කැබැල්ල (01),

කැබලි අංකය 47
**ඉඩමේ නම: දංගහමුලවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: තෙන්නකෝන් මුදියන්සේලාගේ ටිකිරි බණ්ඩාර තෙන්නකෝන්; ප්‍රමාණය: හෙක් 0.0658.**

මායිම් —:

*උතුරට* : 19 හා 44 වැනි බිම් කැබලි; *නැගෙනහිරට* : 44 හා 19 වැනි බිම් කැබලි; *දකුණට* : 19 වැනි බිම් කැබැල්ල; *බටහිරට* : 19 වැනි බිම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩම් වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජූලි මස 29 වැනි දින පෙ.ව. 10.00ට වාරියපොල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 ජූලි මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ. එම්. එච්. එස්. කේ. ජයලත්,
ප්‍රාදේශීය ලේකම්,
වාරියපොල.

2016 ජුනි මස 22 වැනි දින.
වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය..

07 - 523

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : නුඑ/3/1/2/අත්පත්/32.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 03/J/88/D/13.

අංක 1296/9 හා 2003.07.07 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 2ඒ පිටුවේ පළ කරන ලද සංශෝධන දැන්වීමේ සඳහන් කැබලි අංක 03 හා 05 සඳහා අංක 1144/15 හා 2000.08.10 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* III කොටසේ 3ඒ පිටුවේ පළ කරන ලද දැන්වීමේ අවසාන පරිච්ඡේද 2 පහත දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන් බලයලත් අයවලුන් හෝ 2016 ජූලි මස 25 වැනි දින පෙ.ව. 10.00ට නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2016 ජූලි මස 18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තර කර වන්දි මුදල හා ඒ වන්දි මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2016 ජුනි මස 16 වැනි දින.
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 524

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.